# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 34 දරන මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 සැප්තැම්බර් මස 07 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 සැප්තැම්බර් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

**1983 අංක 34 දරන මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත**

[සහතිකය සටහන් කළේ 1983 සැප්තැම්බර් මස 07 වන දින]

එල්. ඩී.—ඕ. 37/82

**මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා)" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක්, එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස කරගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද : — පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා කීපය එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස කරගෙන ගොස් ඇති හා ක්‍රියාත්මක කර ඇති හෙයින් සහ එය සංස්ථාගත කරනු ලැබීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද, ඒ ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 34 දරන මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — **ලුහුඬු නාමය.**

2. මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට සහ ඉන් පසු (මෙහි මින්මතු "සමාජ කවය" යනුවෙන් සඳහන් කරනු ලබන) මුස්ලිම් කාන්තා සමාජ කවයේ (ලංකා) දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් ද "මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා)" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ යුතු හා කළ හැකි ද විය යුතු ය. — **මුස්ලිම් කාන්තා සමාජ කවය (ලංකා) සංස්ථාගත කිරීම.**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— **සංස්ථාවේ පොදු පරමාර්ථ.**

(අ) ජාත්‍යන්තර සුහදතාවය සහ මිනිස් වර්ගයාගේ සහෝදරත්වය නංවාලීම, වැඩිදියුණු කිරීම හා ආරක්ෂා කිරීම ;

(ආ) සෞඛ්‍ය, අධ්‍යාපනික, සංස්කෘතික සහ සමාජ අවශ්‍යතාවයන් සහ ආර්ථික ශුභ සිද්ධිය සඳහා කුල භේද, ආගම් භේද, වර්ණ භේදයන්ගෙන් තොරව, කාන්තාවන්ගේ සහ ළමුන්ගේ වර්ධනය, වැඩි දියුණුව සහ ශුභ සිද්ධිය උදෙසා ප්‍රයත්න දැරීම හා වැඩ කිරීම ;

(ඇ) සියලු දෙනාගේම ප්‍රයෝජනය සහ යහපත සඳහා පාසැල් පන්ති, සමාජ ශාලා, කියවීම් ශාලා, බෙහෙත් ශාලා,

ආරෝග්‍ය ශාලා, අනාත් දරු නිවාස, ළමා නිවාස, මහලු නිවාස සහ වෙනත් ස්ථාන හා පහසුකම් සංස්ථාපනය කිරීම, නඩත්තු කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඇ) විපතට පත්වූවන්ට, දිළිඳුන්ට සහ රෝගී පුද්ගලයන්ට ආධාර උපකාර කිරීම සහ ඔවුනට සඟන සැලසීම ;

(ඉ) සංස්ථාවේ අරමුණු ඉදිරියට ගෙනයාම සඳහා රැස්වීම්, සම්මේලන, දේශනා, උපදේශක පංති පැවැත්වීම සහ ඒවාට අනුබලදීම ;

(ඊ) සමාන ආයතන සමග අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම ;

(උ) ඉහත දැක්වෙන පරමාර්ථ ඉටුකර ගැනීමට ආනුෂංගික වූ හෝ හිතකර වූ වෙනත් සියලු ක්‍රියා සහ දේවල් කිරීම, හෝ, ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක යථෝක්ත සංගමයේ යහපත හා ශුභසිද්ධිය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම, වැඩි දියුණු කිරීම සහ වර්ධනය කිරීම සඳහා කළ යුතු සියලු ක්‍රියා සහ දේවල් කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුම් ආරම්භ කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වැසීම, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම සහ සංස්ථාවේ පරමාර්ථ ඉටුකිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස සේවයේ නිරත කිරීම, සේවයේ නියුක්ත කිරීම හා සේවයෙන් නෙරපීම ද ඇතුළුව, සංස්ථාවේ සියලුම පරමාර්ථ හෝ ඉන් යම් පරමාර්ථයක් ඉටුකර ගැනීම සඳහා හෝ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කරුණු සහ දේ ඉටු කිරීම සඳහා සංස්ථාවට බලය තිබිය යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත්කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව එහි නිලධරයන්ගෙන් සහ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ සහ එම රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන සෙසු තැනැත්තන්ගෙන් සමන්විත විධායක කමිටුවක් විසින් පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී ධුර දරන සමාජ කවයේ විධායක මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම විධායක මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

6. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඒ රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන් මේ පනතේ විධිවිධානවලට හා ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන රීති සාදනු ලැබිය හැකි ය. එකී රීති සෑදීමෙන් පසු එවැනිම රැස්වීමක දී ඒ ආකාරයෙන්ම ඒවා වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

7. මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙහි දී පවතින සමාජ කවයේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, සමාජ කවයට අය විය යුතු හෝ ගෙවිය යුතු සියලු ණය, දායක මුදල් සහ සහභාග මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය. සමාජ කවයෙන් ගෙවිය යුතු සහ සමාජ කවයට අය විය යුතු ණය.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, තෑගි කිරීමක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ වෙනත් ආකාරයකින් හෝ සංස්ථාව සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාරගෙන තබා ගැනීමට නීතියෙහි ලා සංස්ථාවට හැකිවිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමට, උකස් කිරීමට, බදු දීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමට පූර්ණ බලය ඇතිව, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් තබාගත යුතු ය. සංස්ථාවට චංචල හා නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි වූ තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර, එම අත්සන් කිරීම, සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

10. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් කියන තැනැත්තන් හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 යි. (විදේශීය) රු. 40 යි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නම් වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.